***<u>දේශනයේ සම්පූර්ණ පිටපත මෙසේය…</u>***

"ජාතික නිදහස් පෙරමුණේ දේශපාල මණ්ඩල සභික, ජාතික ගොවි ව්‍යාපාරයේ ජාතික සංවිධායක කරුණාතිලක හේරත්. අද අපි විශේෂයෙන්ම මේ මාධ්‍ය සාකච්ඡාවට සම්බන්ධ වෙන්නේ අපේ රටේ ජනතාවට "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" උදා කරනවා කියලා බලයට ආපු, "පුනරුද යුගයක්" අභිශේක කරනවා කියලා බලයට ආපු මාලිමා ආණ්ඩුව, ජාතික ජන බලවේග ආණ්ඩුව මොහොතේ අපේ රටේ ජනතාවට කරමින් සිටින ප්‍රහාරයන් ගණනාවක් පිළිබඳව එල්ල කර ඇති පීඩනයන් ගණනාවක් පිළිබඳව අපේ රටේ ජනතාවත්, මාධ්‍යත් දැනුවත් කිරීම සඳහා තමයි අද අපි මේ මාධ්‍ය සාකච්ඡාව පවත්වන්නේ.

දැන් අපි දන්නවා ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට ඇවිල්ලා රටට දීපු පොරොන්දු සියල්ල දැන් උඩු හුළඟේ ගහගෙන යන මට්ටමට පත්වෙලා ඉවරයි. ඒවා හිස් ප්‍රලාප බවට පත්වෙලා ඉවරයි. දෛනිකවම දිනපතාම අපේ රටේ ජනතාව වෙත ප්‍රහාරයන් මාලාවක්, ප්‍රහාරයන් පොකුරක් එල්ල කරමින් ඉන්නවා. ඔබ කවුරුත් දන්නවා මේ ඊයෙ පෙරේදා වෙනෙකුට අපේ රටේ විදුලිගාස්තු වැඩි කිරීම සඳහා අවශ්‍ය පිඹුරුපත් සකස් කරලා අවසානයි.

ඊට කලින් මේ අවුරුද්දේ මේ වෂර්ය මුල ජනවාරි මාසේ වැඩි කිරීමක් සිද්ධ කරා. 11.57%කින්. ඊට පස්සේ අප්‍රේල් මාසේ 14%කින් විදුලි ගාස්තු වැඩි කරා. දැන් ආපහු නැවත වතාවක් සාපේක්ෂා අගයෙන් මත එකතු කරා අගයේ මතුගාස්තු වැඩි කිරීම 18% දක්කවා විදුගාස්තු වැඩි කිරීම සඳහා අවසර ඇරගෙන තියෙනවා.

එතකොට ඒ පැත්තකින් ඉන්දන මිල පහුගිය කාලය පුරා දිගින් දිගට වැඩි වෙමින් ආවා. එහි බර අපේ රටේ සාමාන්‍ය ජනතාවට, අපේ රටේ විශේෂයෙන් ගොයි ජනතාවට, ශිෂ්‍යොයින්ට කාන්තාවන්ට ධීවරයන්ට වැඩ කරන ජනතාව ආදී වශයෙන් සමස්ත ජනතාවට මේ ප්‍රහාරයන් එල්ල කරමින් තියෙන්නේ. අනිත් පැත්තෙන් ඉන්දන මිල වැඩි වුණා, ගෑස් මිල වැඩි වුණා. වැට් බදු පරාසය වැඩි කරා. දවසින් දවස දවසින් දවස ජීවන බර උග්‍ර කරමින් ජීවත් වීමේ අමාරුකම් වධර්නය කරමින් ඉන්න තත්වයක් තමයි අපේ රටේ ජනතාවට තියෙන්නේ.

අපි දැක්කා මේ තත්ත්වය තුළ ආණ්ඩුවේ සමහරු කියන්න පටන් ගත්තා අපි ඒකක 180 න් පහළ කට්ටියට වැඩි කරන්නේ නැහැ කියලා. දැන් මොක මේක ඇත්ත කතාව මොකක්ද? හැබැයි ඒකක 180 පල්ලහ අයට ඉදුලිබිල වැඩි කරේ නැති වුනාට, අපි දන්නවා ලී මලකින් ගිහිල්ලා ලී කෑල්ලක් ගන්නකොට, ඒ ලීයේ මිල වැඩි වෙනවා. වී මෝලකට ගිහිල්ලා වී ටිකක් අඹරනකොට වී ටික අඹර ගන්නකොට ඒකේ මිල වැඩි වෙන්න

පටන් ගන්නවා. වෙළඳ සැලට ගිහිල්ලා බඩු ගන්නකොට ඒ මිල වැඩි වෙන්න පටන් ගන්නවා. භාණ්ඩ හා සේවා ලබාගත් ඒ මිල වැඩි වෙන්න පටන් තියෙනවා. එක පැත්තකින් වැට් බදු වැඩි කරනවා. විදුලිගාස්තු වැඩි කරනවා. ඉන්දන මිල වැඩි කරනවා. ගෑස් මිල වැඩි කරනවා. මේ විදියට ජනතාව මත දවස ගානේ දිනපතාම ප්‍රහාරයන් මාලාවක් එල්ල කරමින් ඉන්නවා ජාතික ජනබලවේග ආණ්ඩුව.,

අපි දැක්කා. ඒ වගේම අපි දන්නවා විශේෂයෙන්ම අපේ රටේ ගොවි ජනතාව මේ එල්ල කරපු, අපි දැක්කා වැඩබදු පාරාසය වැඩි කරනකොට කෘෂි යෙදවුම් වල මිල වැඩි වෙන්න පටන් ගත්තා. බීජ මිල වැඩි වෙන්න පටන් ගත්තා. පොහොර  මිල වැඩි වෙන්න පටන් ගත්තා. අනිත් පැත්තෙන් ඉන්දන මිල වැඩි වෙනකොට ඔවුන්ගේ ප්‍රවාහන වියදම වැඩි වෙන්න පටන් ගත්තා. ඔවුන්ගේ ට්‍රැක්ටර් කුලීය වැඩි වෙන්න පටන් ගත්තා. වතුර පොම්පේ මිල වැඩි වෙන්න පටන් ගත්තා. එතකොට ඒ සියලු මිල වැඩිවීම් වෙන අතරේ තමයි මේ විදුලිබිල වැඩි වෙලා තියෙන්නේ. එතකොට මේ එකකට එකක් වූ ප්‍රහාර මාලාවක් විදිහට තමයි අද මේ ජාතික ජනබලවේග ආණ්ඩුව අපේ රටේ සමස්ත ජනතාවටත්, විශේෂයෙන් ගොයි ජනතාවටත් මේ ප්‍රශ්න පීඩනය එල්ල කරලා තියෙන්නේ.

අපි දන්නවා දැන් පොහොර සම්බන්ධ ප්‍රශ්නය. තාම... මොකක්ද මේ ආණ්ඩුව එන්න මුලින් කිව්වේ. මට මතකයි දේශපාලනය වේදිකාවේ මේ ගොල්ලෝ කිව්වාඵ කෝලි කුට්ටු ගෙඩියේ නැට්ට හයි කරන කතා කිව්වේ. කෝලි කුට්ටු ගෙඩියේ නැට්ට හයි කරලා මේක හොඳට වෙළඳ පොළට යවන කතා කිව්වේ. ඊළඟට “ගෝමික උඩුගමසූයර්” වගේ විශේෂඥයෝ ගෙන්නලා අපේ රටේ පොහොර ටික හදලා අපේ ගොවි ජනතාවට දෙන කතා කිව්වේ. “ඩ්‍රෝන” මැෂින්වලින් ගොවින්ගේ කෘෂි රසායන ප්‍රශ්නය විසඳලා ඒවට අදාල පහසුකම් දෙන කතා කිව්වේ. නමුත් අද මොකද වෙලා තියෙන්නේ? අද මේ ජාතික ජන බලවේග ආණ්ඩුව අසමත් වෙලා තියෙනවා. අපේ රටේ ගොවි ජනතාවගේ වගා කිරීමට අවශ්‍ය නියමිත පරිදි පොහොර ටික දෙන්න. සාධාරණ මිලට පොහොර ටික දෙන්න.,

අද මේ ආණ්ඩුව මොකක්ද පළවෙනි වරට මේ අබර්දය පටන් ගන්න වෙලාවේ, පටන් ගන්න මුල්ම අවස්ථාවේ කරේ? චක්‍රලේකයක් ගැහුවා ප්‍රධාන පොහොර වගර් තුනට, රජයේ පොහොර සමාගම් වලින් තමයි දෙන්න කියලා. පුද්ගලික සමාගන් වලින් ඇත් කරලා. දැන් මොකක්ද ඒකේ ප්‍රතිඵලය සිද්ධ වුණේ? අද අනුරාධපුරේ පොළොන්නරුව ආදී ප්‍රධාන කෘෂිතාමරීක ප්‍රදේශවල ගොවි ජනතාවට තමන්ට ගැලපෙන යූරියා ටික, ටී එස් පී ටික හොයාගන්න නැති වෙන තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. හොයාගන්න විදිහක් නැහැ. අනිත් පැත්තෙන් ඒවායේ මිල ඉතා සීඝ්‍රයෙන් වැඩි වෙලා තියෙනවා. හොයාගන්න බැරි විදිහට.

ගොවිජන සේවා, දැන් ආණ්ඩුව මොකක්ද මේක ගැන කියන්නේ? මේ නිලධාරීන් පිට දොස් පවරන්න පටන් අරන් තියෙනවා. අපේ රටේ ගෝවිජන සේවා දෙපාමේර්න්තුව, පැල්ලෙහා ගමේ කලාපෙට වග කියන මේ

කෘෂිකමර් පයෙර්ෂණ නිලධාරි මහත්තයා ඉන්නවා. ගෝවිජන සේවා මධ්‍යස්ථානයට අදාළව ගමේ ඒ වැඩටික කරන්න. ඒ අදාල තොරතුරු ටික ගන්න පුළුවන් ක්‍රමවේදයක් තියෙනවා. හැබැයි මේ ආණ්ඩුවේ අකායර්ක්ෂමතාවය, මේ ආණ්ඩුවේ වැඩ බැරිකම, මේ ආණ්ඩුවේ දුවර්ලකම හින්දා ඒ නිලධාරීන්ගෙන් වැඩ කරගන්න බැරි මට්ටමට පත් වෙලා තියෙන්නේ.,

මේ ආණ්ඩුවට අපි කියන්න ඔය ලොකු වැඩ කරන්න බැහැ. මේ ආණ්ඩුව කිව්වේ මොකක්ද? මේ ආණ්ඩුව මම දැක්කා පහුගිය මැයි පළවෙනිදා අර පොළොන්නරුවේ රාජ්‍යනායකයා කියාගත්ත නියෝජ්‍ය ඇමතිවරයා කියනවා, එයාලා රට භාර ගන්නකොට එක පොහොර ඇටයක්වත් තිබ්බේ නැහැ කියලා.

පොහොර ඇට විදිහට නෙමෙයි තිබ්බේ. පොහොර මිටි විදිහට තිබ්බේ. පොහොර ටොන් විදිහට තිබ්බේ. ආණ්ඩුව බාර ගන්නකොට. එක එක බොරු කියලා මේ ප්‍රශ්නය උග්‍ර වෙනකොට වෙන පැත්තකට පැන යන්න බැහැ. මේ ආණ්ඩුව අසමත් වෙලා තියෙනවා. මෙවැනි අරබුධකාරී වටපිටාවකදී අපේ රටේ ගොවි ජනතාවට කොහොමද අවශ්‍ය පොහොර ටික දෙන්නේ කියලා. දැන් උදාහරණයක් විදිහට ගත්තට පස්සේ මොකක්ද? දැන් අපේ අසල් වාසී රට තමයි ඉන්දියාව. ඉන්දියාවේ අද යූරියා කිලෝ එක්ක මිල කීයද? ලංකාව රුපියල් වලින්. රුපියල් 20ක් 30ත් අතර පරාසක තියෙන්නේ.

දැන් අපි, අපේ ගොයි ජනතාව අද කීයක් දීලාද ගන්න ඕනේ යූරියා කිලෝවක්... මිල රුපියල් 300කට ආසන්න මිලක් දීලා තමයි කීලෝවක් ගන්නේ... ඉතින් කොහොමද අපේ ගොවි ජනතාව තරග කරන්නේ?,

විදේශී ආනායනික අථර්පල් එක්ක, එළවලු එක්ක, අනිත්කුත් ද්‍රව්‍යයත් එක්ක, කොහොමත් තරඟ කරන්නේ. තරග කරන්න විදිහක් නැහැ. අපේ දවසින් දවස දවසින් දවස සිද්ධ වෙන තමයි අපේ ගොවියා ගොවි තැනෙන් ඇත් කරවන එක. ඒ තත්වයට පත් වෙලා තියෙන්නේ. පෝර ටික දෙන්න අසමත් වෙලා තියෙනවා. හොඳ බෙදා හැරීම් ජාලයාවක් නැහැ. පුද්ගලික අංශයේ බෙදන එකක් නැවැත්තුවා. මේගොල්ලෝ පවරාගත්තා. මේගොල්ලොට හොඳ කෘෂි ප්‍රතිපත්තියක් නැහැ. කෘෂි වැඩපිළිවෙලක් නැහැ. කොහොමද ගොවි ජනතාවගේ ඒ තොරතුරු ටික හොයාගන්නේ. මේ සමහර “අමු දත්ත” මත පදනම් වෙලා මේ වැඬේ කරන්න බැහැ. ඒකට අදාල වැඩපිළිවෙලක් තියෙනවාද..? නැහ.. අපි දැක්කේ නැහැ මේ ආණ්ඩුව ඇතුලේ හොඳ වැඩ පිළිවෙලක්.

මගෙන් ඇහුවොත් යම් කෙනෙක්, මගෙන් ඇහුවොත් මේ ආණ්ඩුවේ දුරුවලම අමාත්‍යාංශය මොකක්ද කියලා මම කියන්නේ කෘෂිකමර් අමාත්‍යාංශය. ඇයි? ඒ. අමාත්‍යාංශයේ මේ තමන්ගේ විෂය පථයට අදාල කිසිදු වැඩක් කරන්නේ නැහැ. බීජ ටික දෙන්න අදාල වැඩපිළිවෙලක් හදන්නේ නැහැ. පොහොර ටික

දෙන්න අදාල වැඩපිලිවෙලක් හදන්නේ නැහැ. වාරිමාගර් ටික නඩත්තු කරන හොඳ වැඩපිලිවෙලක් හදන්නේ නැහැ.,

දැන් අපි දැක්කා අපේ රටේ ජනාධිපතිවරයා විදියට පත්වෙලා ඉන්නේ "සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ" හිටපු සභාපතිවරයෙක්. හිටපු කෘෂිකමර් ඇමතිවරයෙක්. හැබැයි අපේ රටේ කෘෂිකමර් නියෝජ්‍ය ඇමති කවුද? කෘෂි කමර් නියෝජ්‍ය ඇමති කිව්වේ කවදාවත් කිසිම වගාවක් කරපු කෙනෙක් නෙවෙයි. කවුරු හරි දීපු දෙයක් කාපු මනුස්සයෙක් මිස වගා කරපු එක්කෙනෙක් නෙවෙයි. එයාට පුළුවන් හොඳට "විචිත්‍ර බණ" කියන්න. හැබැයි එයාට මේ අපේ රටේ කෘෂි කමර්ාන්තයේ තියෙන ප්‍රශ්න සම්බන්ධයෙන්, ගොවි ජනතාව මුහුණ දෙන ප්‍රශ්න සම්බන්ධයෙන් ඔහුට මේ අත්දැකීමක් නැහැ. ඔහුට වගකීමක් නැති මට්ටමට ඉන්නේ.

අපි තවත් දැක්කා පහුගිය මැයි පළවෙනිදා අව් කණන්නාඩි කූට්ටමුකුත් දාගෙන ඇවිල්ලා කියනවා, අපිට පොහොරමිල වැඩි කරන්න සිද්ධ වේවි ඉදිරියට කියලා. ඉතින් පොහොරමිල වැඩි කරන්න සිද්ධ වෙයි කියලා කියන්නේ කවුද? එදා අර අමුඩයක් ගහගෙන මේ කොළඹ හැමතැනම විරොධතා කර කර හැමතැනම පෙළපාලි ගිය එක්කෙනා පොහොර මිල අඩු කරන්න කියලා. හැබැයි අද පොහොර ටික දෙන්න බැරි වෙලා තියෙනවා.,

අනිත් පැත්තෙන් දැන් කෘෂිකමර්වරයා. කෘෂිකමර් ඇමතිවරයාට කෘෂි කර්මර්ාන්තයේ අවශ්‍ය ප්‍රශ්න ටික විසඳනවා වෙනුවට, ඒවට ප්‍රතිපත්ති හදනවා වෙනුවට එයාට කරගන්න වෙන වෙන වැඩ ටිකක් තියෙනවා. එයා ඒ වැඩ ටික කරගෙන යනවා. අපිට ඒකට ගැටළුවක් නැහැ. හැබැයි ලාල්කාන්ත කෘෂි කමර් ඇමතිවරයා තමන්ට කියලා පළාම්ටියක්වත් හදාගත්ත මනුස්සයෙක් නෙවෙයි. කම්කරු සටන් පෙරමුණුවල කම්කරුවන්ගේ වෘත්තීය සමිති ක්ෂේත්‍රය තමයි වැඩ කරමින් හිටියේ. අද මේක නිසා කෘෂිකමර්ය, අපේ රටේ ගොවි තැන, කෘෂිකමර් ක්ෂේත්‍රයේ බරපතල කඩා වැටීමක් වෙලා තියෙන්නේ... මේ හැම ක්ෂේත්‍රයකම කඩා වැටීමක්. වී ගෝවි තැනෙත් එහෙමයි. එළවලු ගොවි තැනෙත් එහෙමයි. අථර්ාපල් ගොවි තැනෙත් එහෙමයි. ලූණු ආදී අනෙකුත් සියලු වගාවල, කෘෂි කමර්ාන්තය බරපතල කඩා වැටීමක තියෙන්නේ.

ඉතින් මේ තත්ත්වය තුළ, දැන් අපි දැක්කා පහුගිය කාලයේ පොහොර හදලා දෙන හැටි, පොහොර හදලා අපේ රටේ ගොවි ජනතාවට පැක් කරලා දෙන හැටි ගැන කතා කරනවා. එහෙම කියලා දැන් මොනවද කරන්නේ. ඒ අස්සේ මොකද වෙන්නේ? ඒ අස්සේ මේ අර පරණ වැඩේ දැන් ආයෙත් පටන්ගෙන තියෙන්නේ පොහොර ටික ගෙන්න. අපි දැක්කා වාතර්ා පළවුණා. කසකස්ථානයෙන් අඩුමිලට පොහොර ඇරගෙන ඕමාන්වලදී රීපැක් කරලා, ඒකෙන් ගාණක් ගහගන්න, මාටියා ගහගන්න වැඩපිළිවෙලකටත් යනවා කියලා වාතර්ා පළවෙලා තියෙන්නේ.,

ඉතින් මේ මේ මෙවැනි තත්ත්වයකට අපේ රටේ කෘෂි කමර්ාන්තය පත්වෙලා. අනිත් පැත්තෙන් විශේෂයෙන් කියන්න ඕන, අපිට මතකයි මේ මේ අය විපක්ෂයේ ඉන්නකොට නාමල් කරුණාරත්න ලාල්ලා ආදී මේ කට්ටුව විපක්ෂයේ ඉනකොට මොකද කරේ? අර පී හැරිසන්ලා එදා පිට රටින් හරක් ගෙනල්ලා කරපු ඒ ගසා කෑම ගැන, කෝටි ගණන් ගසාකෑම ගැන කතා කරා. දැන් මොනවද වෙලා තියෙන්නේ... දැන් මේ මෑතක සිට "ගව සුක්‍රාණු" ලබා ගැනීම සඳහා පකිස්තානෙන් ගොනුන් ගෙන්නෙව්වා. දැන් දැන් හොයාගෙන තියෙනවා ඒ සතුන්ට, ඒ සතුන්ගේ මේ වැඩේ කරගන්න බැහැලු, ඒකත් අසාර්ථකයි කියලා.

ඔවුන් දැන් නිරෝධායනට ලක් වෙලා තියෙන්නේ. ඔවුන්ට වෙන ලෙඩ වගයකුත් ඇවිල්ලා කියලා. මේ විදිහට එක පැත්තකින් මේ ආණ්ඩුවේ නොහැකියාව, හා නොසැලකිල්ල. අපි දන්නවා අර ගම්වල මිනුස්සු අතර හොඳ කතාවක් තියෙනවා. මේ ආණ්ඩුවේ කයිය තියෙනවා කෝටියක්. ආණ්ඩුවේ කයිය කෝටියයි. හැබැයි ආණ්ඩුවේ වැඩ දොයිතුවයි. දොතුවක්වත් නෑහැ. කියන මට්ටමට දැන් මිනිස්සු පත් වෙලා තියෙන්නේ.

ඇයි.... ඒ තරමට වගා කරලා වගා කරලා ඒ කන්නේ පටන් ගන්නකොට ජනතාවට අවශ්‍යා බීජ ටික නැත්නම්, පොහොර ටික නැත්නම් ඒ පිළිබඳ විශ්වාසය නැත්නම්, මේ වගා කරාට පස්සේ මේ මේකේ අපිට යන්න පුළුවන් දුරක් තියෙනවා කියලා විශ්වාසයක් නැත්නම්. හැම පැත්තෙන්ම ඔහුට එන්නේ පීඩනයක් නම්, හැම පැත්තෙන්ම ඔහුට එන්නේ දරාගන්න බැරිකමක් නම්, ඉන්දන මිල වැඩිවෙමින් ප්‍රවාහ ගාස්තු වැඩි වෙනවා නම්, බීජ මිල වැඩිවෙන කොට, වැට් ගහනකොට, විදුලි බිල වැඩි වෙනකොට අනෙකුත් ඉන්දන මිල වැඩි වෙනකොට, ඩොලර් වල අගය ඉහළ යනකොට මොකද වෙන්නේ...

දැන් හොඳට බලන්න... ඩොලර් එකේ අගය මේ මාස හතට ඒකක තිහකින් ඉහළ ගිහිල්ලා තියෙන්නේ. කාටද ඒ පීඩනය එන්නේ? පිට රටින් බීජ එනකොට ඒ බිල වැඩි වෙනවා. පොහොර ටික ගෙනෙනකොටත් ඒ ටික වැඩි වෙනවා. ඉතින් දිගින් දිගට දිගින් දිගට මේ ප්‍රශ්නය ඉස්සරහට ආවට පස්සේ අපේ රටේ ගොවි ජනතාව ගොවිකමෙන් ඈත් වෙන්න පටන් අරන් තියෙන්නේ. මාලිමා ආණ්ඩුවට අපේ රටේ ගොවි ජනතාවට තියෙන මේ ප්‍රශ්නය විසඳන්න වුවමනාවක් නෑහැ.

දැන් හරියට නම් දැන්.... අපේ වරායන් ටික දෙන්න, විදුලිය දෙන්න, සූයර් බලාගාර ටික දෙන්න ඉන්දියාවත් එක්ක සාකච්ඡා කරනවනේ. අන්න ඉන්දියාවේ ගොවියාට හම්බවෙනවා නම් ලංකාව මුදලින් රුපියල් 25කට 30කට පොහොර, ඒකට යම් බදු ගාස්තුවක් ඇතුලත්ව හෝ අපේ රටේ ගොයි ජනතාවට අවශ්‍යා යූරියා ටික පොහොර ටික ගෙනත් දෙන්න මේ මැදිහත් වෙන්න ඕන. රාජ්‍යාතාන්තික මැදිහත් වීමක් කරන්න ඕන. හැබැයි මේගොල්ලෝ ඒක කරන්නේ නෑහැ. මේගොල්ලෝ ඒක කරන්නේ නෑහැ. දැන් අපි දන්නවා

සමහරවිට "චීනය" වගේ රටක් එක්ක ගනුදෙනු කළොත් අපේ රටට අවශ්‍ය පොහොර ටික ගෙන්න ගන්න පුළුවන්. ඒකට ඔය "හෝමුස්" ඒ මේ සමුද්‍ර සන්ධියේ තියෙන ඒ ගැටුම එච්චර ලොකුවට අදාල වෙන්නේ, සෘජුව බලපාන්නේ නැහැ. ඉතින් ඒ වගේ දේවල් කරන්නේ නැහැ. මේ ටික සීමා කරලා පුද්ගලික අංශයේ තිබ්බ ඒ පොහොර ටික බෙදා හරින දේවල් ටිකත් ඇරගෙන "සදරීයල් පන්නයේ" වැඩකින්ම මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.,

අපි කියන්නේ ආණ්ඩුව වහාම තේරුම් ගන්න ඕන මේ ගොවි ජනතාවගේ ප්‍රශ්නය වහ වහා මැදිහත් වෙලා විසඳුමක් දෙන්නේ නැත්නම් ඇතිවෙන දේ තමයි ඉදිරියේ අනිවාර්යයෙන්ම ආහාර සුරක්ෂිතතාවය ඉතා තදබල විදිහට බිඳ වැටෙනවා. දැමුත් බිඳ වැටිලා තියෙන්නේ. දැමුත් බිඳ වැටිලා තියෙන්නේ.... ඉදිරියේ අපිට දරාගන්න, අපිට හිතාගන්න, විශ්වාස කරන්න අපහසු මට්ටමින් පවා "කුස්සියේ ආර්ථිකය" බිඳ වැටෙනවා කියන්නේ අපේ ආහාර සුරක්ෂිතතාව බිඳ වැටෙනවා. ආහාර සුරක්ෂිතාව බිඳ වැටෙනවා කියන්නේ ජාතියේ බඩගින්නට. ජාතියටම බඩගින්නේ ඉන්න සිද්ධ වෙනවා.

ඉතින් මෙන්න මේක නිසා අපි කියන්නේ, මේ තත්ත්වය වෙනස් කරන්න ඕන. අපේ රටේ කෘෂිකමර්ය කාලාන්තරයක් තිස්සේ ආරක්ෂා වෙමින් ආවා. ඔය 76ක අවුරුදු සාපයක් ගැන කතා කරාට ඒ 76 අවුරුදු සාපය ඇතුලෙත් අපේ රටේ කෘෂි කමර්ාන්ත්තය යම් ප්‍රමාණයකට යම් ප්‍රමාණයකට අඩුපාඩු තිබියදී වුවත් තිබ්බා. හැබැයි 76 වසරක සාපයක් නිමා කරනවා කියලා ආපු අය කෘෂි කමර්ාන්තය නැති බංගස්ථාන කිරීමේ සාපය භුක්ති විඳින්න ඉස්සරහට ලැස්සි වෙමින් ඉන්නවා.,

ඒක හින්දා අපි කියන්නේ මේ තත්ත්වය වෙනස් කරන්න ඕන. අපේ රටේ අපේ රටේ මේ කෘෂි කමර්ාන්ත ක්ෂේත්‍රයට අදාළ ඕන තරම් ප්‍රාමාණික විද්‍යාඥයෝ ඉන්නවා. ඒගොල්ලෝ වෙනුවට අත්දැකීම් නැති දුරුවල තමන්ගේ හෙන්චයියෝ, තමන්ගේ පාක්ෂිකයෝ තමන්ගේ කාඩවර්රු ඇතුළට දාගෙන මේ වැඩේ කරන්න හදන්නේ.

අපි දන්නවා අපේ රටේ රජයේ පොහොර සමාගම් කීපයක් තියෙනවා. ඒකට අපේ රටේ ජනතාව බදු ගෙවනවා. අපේ රටේ මහාණ්ඩාගාරය මුදල් වෙන් වෙනවා. ඒ වගේන්, ඒවගෙන් ප්‍රයෝජන ගන්න ඕනේ. ඒවියින් ප්‍රයෝජන අරගෙන අපේ රටේ ජනතාවගේ අවශ්‍ය පොහොර අවශ්‍යතා ඉටු කරන්න ඕන. අපට ටී එස් පී කොච්චර අවශ්‍යද? එම්. ඕ. පී කොච්චර අවශ්‍යද? යූරියා කොච්චර අවශ්‍යද කියන දේ හොයාගෙන ගොවි ජනතාවට දෙන්න වැඩපිලක් හදන්න ඕනේ.,

අපිට පේන්නේ නැහැ. මේ ආණ්ඩුව කළමනාකරණය අතින් ඉතාම අතිශය දුවර්ල මට්ටම තියෙන්නේ. ඉතාම පහල දුවර්ල තත්වයට පත් වෙලා තියෙන්නේ. වැඩක් කරන්නේ නැහැ. නිලධාරීන්ගෙන් වැඩ ගන්න දන්නේ නෑ. ඔවුන්ව වැඩ කරන නොකරන නිකම්මු බවට පත් කරලා ඔවුන් අධෛයර්යට පත් කරලා ඔවුන් පැත්තකට තල්ලු කරලා දාලා තියෙන්නේ. ඒක හින්දා අපි කියන දේ තමයි අපි ඉල්ලන්නේ ආණ්ඩුවෙන්. මේ කෘෂිකමර් ක්ෂේත්‍රයේ ගොවිතැනට අදාළ ඒ කෙෂේත්‍රයේ බිඳ වැටීම සෙල්ලම් විදිහට සලකන්න එපා. මේක ජාතියේ බිඳ වැටීමේ ආරම්භය. ජාතියට කන්න නැතුව ජාතියට බඩගින්න ඉන්න සිද්ධ වුනොත්, එහෙම එතනින් එහාට රටක් නැහැ. එතනින් එහාට ජාතියේ පැවැත්මක් නැහැ.

ඒක හින්දා අපි කියන්නේ... ජාතික ජාතික ගොවි ව්‍යාපාරය විදිහට අපි ඉල්ලා සිටින්නේ. මේ තත්ත්වය වෙනස් කරන්න වහාම ආණ්ඩුව මැදිහත් වෙන්න. කෘෂිකමර් ඇමතිවරයෙක්නේ ජනාධිපතිතුමා. හිටපු කෘෂිකමර් ඇමතිවරයෙක්නේ. සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ හිටපු සභාපතිවරයෙක්නේ. පාරේ පිට කොටුවේ පෝරමිල අඩු කරන්න උද්ඝෝෂණාන කරපු කෙනෙක්නේ. ඒවට අදාළ මැදිහත්වීම් කරපු කෙනෙන්නේ එතුමා. මැදිහත් වෙලා හරි මේ ප්‍රශ්නේ විසඳන්න...

අපි හිතන්නේ නැහැ. මේ යන විදිහට එහෙම හරි දේ කරයි කියලා. නමුත් අපි ඉල්ලා සිටිනවා. අපේ රටේ සමස්ත ගොවි ජනතාව වෙනුවෙන් මේ තත්ත්වය වෙනස් කරලා හැම පැත්තකින්ම එන ප්‍රහාරයන්ගෙන් ගොවි ජනතාව ආරක්ෂා කරලා, කෘෂිකමර්ාන්තය ආරක්ෂා කරලා, ඔවුන්ට නිදහසේ තමන්ගේ කටයුතු ඉටු කරන්න, ගොයිතැන් කරන්න අවශ්‍ය වටපිටාවක් හදන්න මැදිහත් වෙන්න.... සහනාධාර වලින් විතරක් මේ වැඩේ කරන්න බැහැ.,

සහනාධාර දුන්නා කියලා, කොළ අච්චු ගහලා කොළ බෙදුවට හරියන්නේ නැහැ. ඇත්ත ප්‍රායෝගිකව සහනාධාර ගොවියට ලැබෙන විදියහක් හදන්න ඕන. ක්‍රමවේදයක් හදන්න ඕන. ඒ ක්‍රමවේදය හැදිච්ච නැති ප්‍රශ්නේ තියෙන්නේ. අනිත් එක තමයි මේවා ඇතුලේ දැන් පොඩි පොඩි කට්ටිය මේ ආණ්ඩුවේ තියෙන සුජාතභාවය බිඳගෙන තියෙන්නේ.

මේ ආණ්ඩුව ඉස්සෙල්ලා කිව්වේ බොරු කිව්වා. ඊට පස්සේ උද්දච්චකන් පෙන්නුවා. උද්දච්ච විදියට කතා කරා. ඊට ඊට පස්සේ හොරකම් කරන්න දැන් පටන් ගෙන ඉන්නේ. දූෂණා වංචා අඩුනැතිව දැන් කරන්න පටන් අරන් ඉන්නේ. පොඩි පොඩි අය පවා දැන් පොඩි පොඩි අය පවා තම තමන්ගේ මඩිය තරක කරගන්න විදිහක් ගැන කතා කරන්නේ. පොහොර ගෙන්නලා ගොවි ජනතාවට දෙනවා වෙනුවට පොහොර “රීපැක් කරලා” ඒකෙන් ගාන කපාගන්නේ කොහොමද කියලා තමයි මේ කල්පනා කරන්නේ. ඒ තැනට දැන් රට පත් වෙමින් තියෙන්නේ. ඒක හින්දා අපි රටේ ජනතාවට කියනවා මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා වහා මැදිහත් වෙන්න කියන ඉල්ලීම ජාතික ගොවි ව්‍යාපාරය විදිහටත් ජාතික නිදහස් පෙරමුණ විදිහටත් අපි ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.",